**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

## ශ්‍රී ලංකාවේ දී හින්දි දිවාස් සැමරේ

2021 සැප්තැම්බර් 14 වන දිනට යෙදුණු හින්දි දිවාස් නිමිත්තෙන් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය වැඩසටහන් සහ තරඟ මාලාවක් සංවිධානය කර තිබිණ. ශ්‍රී ලංකාවේ සිටින හින්දි භාෂාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අය සඳහා ඔවුන්ගේ සාහිත්‍යමය සහ භාෂාමය හැකියාවන් ප්‍රදර්ශනය කිරීම සඳහා වේදිකාවක් නිර්මාණය කරමින් හින්දි භාෂාව ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ විය. කොවිඩ්-19 වසංගතයේ අභියෝගයන් සැලකිල්ලට ගනිමින් මෙම වැඩසටහන් අතථ්‍ය අකාරයෙන් සංවිධානය කර තිබිණ.

2. මෙම දිනය ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින හින්දි භාෂා ලෝලීන්, විද්වතුන්, ගුරුවරුන් සහ ශිෂ්‍යයන් 100කගේ පමණ සහභාගීත්වයෙන් මහත් උද්යෝගයකින් සමරන ලදී. ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා සහ විදේශ කටයුතු සහ සංස්කෘතික රාජ්‍ය අමාත්‍ය ශ්‍රීමතී මීනක්ෂි ලේඛි මහත්මිය විසින් නිකුත් කරන ලද විශේෂ වීඩියෝ පණිවුඩ ද මෙම අවස්ථාවේදී ඉදිරිපත් කරන ලදී. රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙනෙහි පරිවේනාධිපති සහ අධ්‍යක්ෂ අති පූජ්‍ය ආචාර්ය මාඉටිපේ විමලසාර මහා නාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ගෞරවනීය මහා සංඝරත්නය සහ හින්දි භාෂාව ඉගෙන ගන්නා ගිහි පින්වත්හු ද මෙම සැමරුම් සඳහා එක් වූහ.

3. හින්දි කවි, සින්දු ගායනා තරඟ සහ හින්දුස්ථානි සහ බොලිවුඩ් ගීත අනුව සංගීතමය සහ නර්තන ඉදිරිපත් කිරීම් මෙම සැමරුම්වලට ඇතුළත් විය. දෘෂ්‍යමය වශයෙන් අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණ දී සිටින හින්දි භාෂා ලෝලීන් සඳහා විශේෂ වැඩසටහනක් ද සංවිධානය කර තිබිණ. සියළු දෙනා ඇතුළත් වන පරිදි මෙම තරඟ පැවැත්වීම සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින සියවස් ගණනක් පැරණි සංස්කෘතික, භාෂාමය සහ ආගමික බැඳීම් ශක්තිමත් කිරීම සඳහා හින්දි භාෂාව සහ සාහිත්‍යය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ විය.

4. හින්දි දිවාස් සැමරුමේ කොටසක් වශයෙන් දිවයිනම ආවරණය වන පරිදි හින්දි වීඩියෝ පණිවිඩ තරඟ, හින්දියෙන් කතාන්දර කීම සහ හින්දි කවි ගායනා තරඟ වැනි හින්දි භාෂා තරඟ 2021 සැප්තැම්බර් මාසය පුරා අන්තර්ජාලය ඔස්සේ සංවිධානය කර තිබේ.

*****

කොළඹ
2021 සැප්තැම්බර් 15